මෙහෙක් කතාව

අසංවේදී අතීතය තමා වෙත පිළිගන්වමින් තිබුනේ ආදරය යැයි හඳුනාගන්නා ලහිරු, එහි වමත්කාරය සැබැවින්ම අත්විඳිනුවස් ටානා සෙවීමේ උත්සාහයක යෙදෙයි. ඇඩම් සහ සමාර් වෙතින් පිළිතුරක් නොලබන ඔහු මහේල වෙතින් සුපුරුදු මිතුත්වය නොලැබීයාම ගැන පුදුමයට පත්වේ. පීටර් අංකල්ගේ ගෙදර ඔහු නවාතැන් ගන්නේ ළඟදීම පරත් පැමිණෙන දෙමාපියන් මුණගැසීමේ බලාපොරොත්තුවෙනි.

අද වතෑන් සිට

හදිසියේ මා අසලින්ම ඇසුනු ලයාන්විත කටහඬකින් මගේ දැහැන බිඳිගියේය.

''මොකක්ද මේ ලොකු කල්පනාව... මම ළඟට එනවාවත් දැක්කෙ නැහැනෙ...''

මා අසලු සිනාසෙමින් සිටියේ ජානකීය. මා නැවත සැබෑ ලෝකයට පිළිපන්නේ ජානකීගේ කඩහඬකිනි.

''මේ ජානකිත් නැති තැනක නැහැනෙ.'' මට සිතිනි.

''මේ... ඔයාට කරන්න වෙන කිසිම දෙයක් නැත්නම් එනවද මාත් එක්ක ගමනක් යන්න....''

''පිස්සුද....? කොහෙ යන්නද.....? අද ජානකීට ඉස්කෝලෙ නැද්ද....?''

''ඒකෙන් ඔයාට වැඩක් නැහැ. එන්නකො මාත් එක්ක ගමනක්යන්න....'' එසේ කියනගමන්ම ඇය මගේ අතින් අදුගෙන ඉදිරියට යන්නට විය.

''මේ... මේ... ඔහොම පොඩිඩක් ඉන්න... කොහෙ යන්න යන ගමනක්ද? මට ඕවට යන්න වෙලාවක් නැහැ...''

'විකාර නැතිව එන්න ලහිරු අයිය. මේක ඔයා සම්බන්ධයෙන් යන ගමනක්''

මා අැඟේ අත ගසාදමා නැවතිනි.

''මම සම්බන්ධයෙන්... ඔක්කොටම ඉස්සෙල්ල කියන්න මොකක්ද මේ මහ ලොකු ගමන කියල'' ජානකී මොහොතක් මා දෙස බලා සිටියේ තරහිනි.

''අපි යන්නෙ මහේල අයිය හම්බවෙන්න... එයා ගැන ලැබිච්ච ඔත්තුවනට....''

''ඔත්තුවක් මහේල ගැන ජානකීට පිස්සුද ?''

''මට ඇති පිස්සුවක් නැහැ. ඔයාට පිස්සු හැදෙන්න ඉස්සෙල්ලයි ඒක වළක්වන්න හදන්න්.....''

''මොනවද ජානකී මේ කියන්නේ.... අද ජානකීගේ ඉස්කොලෙ වහලද...'' මට අද ගැන ඇතිවන්නේ කෝපයකි. ''මා ගැන මොනවවද එයා කරදර වෙන්නෙ''

''අපේ ඉස්කෝල වහල නැහැ... ඒක යස අඟේට ඇරල තියනව...''

සමහර සිංහල වචන ජානකීගේ මුවින් මතුවන්න් අමුතු ආකාරයකටය. මට සිනහගිය්යේය.

'මොකද හිනාවෙන්නේ....?'

''නෑ මුකුත් නැහැ... එතකොට ඉස්කෝලෙ ගියේ නැත්තෙ යස අඟේට ඒක ඇරල තියනව නම්....? මා ප්‍රශ්න කළේද සිනහසෙමින.

''මගේ සිංහල ගැනනෙ ඔය හිනාවෙන්නෙ... ඔයාගෙ මෝඩකමටයි මම ඊළඟට හිනා-වෙන්නෙ... මම ඉස්කෝලෙ ගියෙ නැත්තෙ ඒකට මම ගිහින් ඉවර හින්ද දැන්....''

''නෑ....'' ඇත්තෙන්ම මට පුදුමය.. ''මේ පුංචි කෙල්ල ඒ තරම් ලොකුවොලාද ''

''නෑ... නෙවෙයි ඔව්, කියන්න ලහිරු අයිය එනවද මාත් එක්ක යන්න නැත්ද?''

''ඔයා මොකටද මහේලගෙ ඔත්තු බලන්නෙ... ජානකීටයි වෙන වැඩක් නැත්තෙ''

''ඔයා නම් මහ නපුරෙක් ලහිරු අයිය. ඔයාට උදව්වක් කරන්න හදනකොට ඔයා හිතන්නෙ කරදරයක් කියල''

''මොකක් ගැනද ජානකී මේ කියන්නේ....''

මම සන්සුන්ව කතාකළෙමි. මට ජානකී ගැන දුකක් ඇතිවිය. ඇත්තෙන්ම මම ඈ ගැන සිතුවේ කරදරයක් ලෙසටය. ජානකීගේ මුහුණට බැරීරුමිතමක් ආරූඩ වනවා මම ඒ අතර දුටිමි.

''ලහිරු අයිය මේ ඇවිත් ඉන්නෙ ටානා නිසා නේද?''

''මොනව... ඔයාට නම් ඇත්තටම පිස්සු ජානකී''

මා සිතේ ලැජ්ජාවක් මතුවිය. ඒ මගේ සිත අනෙකෙකු හඳුනාගත්තාය යන හැඟීම නිසාය.

''ඔයා මට කිව්වේ නැති උනාට කමක් නැහැ. ඒ උනාට මහේල අයියත් එයාට පුල් ටියි මේ දවස්වල. ඔයා ඉස්සර උනේ නැත්නම් පස්සෙ පසුතැවිලි වෙන්න වෙයි''

සම්බන්ධතාවයක් මේ රටේ මුහුදුවෙරළ විසින් ඇතිකරදී තිබේද? ජානකී කියන ආකාරයට මම ඉක්මන් වීය යුතුද? ඉක්මන්වනවා යැයි මා කුමක් කරන්නද? කාලයක් තිස්සේ ඈට නපුරුකම් කළ මම දැන් ඈ පසුපස යමින් ආදරය ඉල්ලා හැඩිය යුතු වෙයිද?

මහේල මොන ආකාරයකට ක්‍රියා කළද මට මගේ යථා ස්වරූපයෙන් වෙනස් වීය නොහැක. ටානා දිනාගැනීමට මහේල තුළ හැකියාවක් ඇත්නම් එය ටානාගේ කැමැත්තට අනුව සිදුවන්නකි. මා හඳුවතේ උපන් ආදරය ථල දැඩිමිටත් පෙරම මියයා යුතුද? දහසකුත් එකක් සිහිවිලි තුළ මීරකෙමින් මම වරුවකටත් වැඩි කාලයක් ගෙවා දැමුවෙමි. මම ක්‍රියා කළ යුතු ආකාරය මෙය යැයි මඟ පෙන්වීමක් මගේ හඳවතේ මතුව නොවී. මම කිසිවෙකුගෙන් උපදෙස් පැතීමට කැමති නොවෙමි. ටානා කෙසේ හෝ මුණගැසිය යුතු යැයි මා හඳවතේ කැලින් මතුවී තිබූ සිව්ල්ල දැන් අඩපණ වී ඇති බවක් මට දැනේ.

කිසිවක් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් තොරව මම ඉතිරි සති දෙක ගෙවා දැමුවෙමි. මේ වනවිට මා හිමිකරගෙන සිටින මානසික තත්වය මට මහා වධයක් විය. මම ලංකාවේ සිටියදී මුහුණදුන් පීඩාකාර මානසික තත්වය මට මතකය. ඒ තත්වයට වඩා වඩා ගුණ කිරීමකින් යුතුව මම ඒ වන විට අත්විඳිමින් සිටියෙමි.

මම හුදකලාවේ සිතිවිල්ලවල බරව් කාලය ගෙවා දැමුවෙමි. එහෙත් ජානකී විසින් වරින් වර මහේලත් ටානාත් පිළිබඳව හොරතුරු මා වෙත රැගෙන ආවාය. ඒ කිසිවක් මා ඊදවීමේ චේතනාවෙන් ඈ නොකළද මම ඒ හැම

කාමරය දෙසට යන්නට විය. මම ඡණිකව ඇඟේ මඟ අවුරා සිටගතිමි.

''ලහිරු අයිය ඔයත් එක්ක මගේ කිසි තරහක් නැහැ. ඒ උනාට මීට පස්සේ ඔයත් එක්ක මම ඔය කිසිදෙයක් ගැන කතා කරන්න එන්නෙ නැහැ...''

මට මා ගැනම දුක සිතිනි. ජීවිතයේ හැම අතින්ම මා හුදකලා ඒ ඇතුළා නොවේද? මිතුරන් පිරිවරාගෙන සතුටින් මා ගතකළ ඒ අතීතය මට සිහිපත් වීය. අද මට සිදුව ඇත්තේ කුමක්ද? එහෙත් වෙනස්වී ඇත්තේ ඒ කිසිවෙකුත් නොව මා ය. සුසුමක් හෙළා ආපසු හිඳසිටි පුටුව වෙත පැමිණි මම එහි වාඩි වුනෙමි. ඉවත්ව යනවා වෙනුවට ජානකීද පැමිණ මා අසලින් වාඩිවීය.

''ලහිරු අයිය.....ඔයාට මේක කොහොම කියන්නද මට තේරෙන්නෙ නැහැ..... ඒ උනාට ඔයාගෙ හිත තව කාටවත් පේන්නෙ කොහොමද ඔයා ඒ ගැන කතා කරන් නැතිව.....''

වෙන කිසිවෙකුටත් වඩා හොඳින් මම ඒ ව දැන සිටින්නෙමි. එහෙත් අතේ ගුලිකරගෙන තිබෙන වැලි අහුරක් ඉවත විසිකර දමන්නක් සේ පහසුවෙන් සිතුවිලි වළියට දමන්නේ කෙසේද....?

''මගේ හිතේ කාටවත් පෙන්නන්න කිසිම දෙයක් නැහැ. අම්මිල ආවහම කොන්වසේෂන් එකට ඉඳලට පස්සෙ මම ගෙදර යනව එයාලත් එක්ක එව්වරයි''

මා අැයට පිළිතුරු දුන්නේ නොරිස්සුම් හැඟීමකින් යුතුවය.

''මේ අහන්න අයිය.... ඔයා මම මේ කියන ජාතික දෙකෙන් එකකට අයිති මිනිහෙක්'' වෙන්න ඕනෙ..... එක්කො ජයග්‍රහණයට උත්සාහයක්වත් නොගෙන පරාජය බාරගන්න. සිදුවීම්වලට මුහුණදෙන්න බැරි බයගුල්ලෙක් වෙන්න ඕනෙ ඔයා.... ඉන්න..... ඉන්න..... ඔම කියල ඉවර නැහැ.... එහෙම නැත්නම් අනිත් කෙනෙක්ගෙන් අබ ඇදෙක උදව්වක්වත් නොගෙන ඉවේටම දේවල් සිද්ධවෙනකම් බලන් ඉන්න කෑමති මහ උඩඟු මිනිහෙක් වෙන්න ඕනෙ ඔයා....''

කිසිවක්ම නොකියා හුන් තැනින් නැඟී සිටී මම කාමරයට ගියෙමි. ජානකී මා සිතා සිටියාට වඩා ෙෝරා ඇත. කෙසේ වුව ද අැය කියන්නේ ඇත්තකි. මා ඔය දෙවිවරගයටම අයත් තැනැත්තෙක් යැයි සිත කියයි. එහෙත් මට වෙනස්විය නොහැක.

එදා හවසට මම අම්මිලා කැඳවාගෙන ඒමට ගුවන්තොටුලට ගියෙමි. පීටර් අන්කල් නාත්ත සමඟ දිගට ම කතබහ්ය. අම්මා මා දෙස ඊමසිලිමත්ව බලනවා මම දුටිමි.

''පුතා ඇදිල ගිහිල්ල වගේනෙ... මොකද මේ....''

''මුකුත් නැහැ අම්ම.....''

ඈ තව තවත් නොයෙකුත් දෑ මා සමඟ කතාබහ කළ ද මම ඒ සියල්ලටම කෙටි පිළිතුරු දුන්නෙමි. නමුත් ගෙදරට පැමිණ පසු ඒ කිසිවක්ම ඈ විමසන්නට නොගියේය. ජානකීද මා තුළ වෙනසක් නැති අයුරින් හැසිරීම මට මහත් සැනසීමක් විය.

පසුදා උදේ විශ්ව විද්‍යාලයට ගිය ගමනට අම්මා සහ තාත්තාද මා සමග පැමිණියේය. උපාධි ලෝගුව ලබාගැනීම වෙනුවෙන් එක් එක් අංශවලට කාලය වෙන්කර තිබිණි. ඒ වෙනුවෙන් අවශ්‍ය වූ මුදල් ගෙවා සියල්ල කලින්ම සකස් කරගෙන තිබුණේ අම්මා විසිනි. ඈ ඈතට නොගොස් මා සමඟය පෝලිමට එකතුවී සිටීම මට තරමක අපහසුවක්ද වීය. එහෙත් ඒ සිතිවිල්ලට වඩා මා සිත තිගැස්සී ගියේ හදිසියේ මා දුටු දසුනිනිය. ටානා්‍ය මම ඉදිරියෙන් තැනක පෝලිමේ සිටියාය. ඈ සිටියේ තනියෙන්ය. මම ඈට කතා නොකර සිටීමට නොහැකි වීය.

''ටානා....''

ලබන කලාපයට



විද්‍යානි මනතුංග
ලියන නවකතාව

5

Photo : Lyndon Foo